රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 240

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ - 7.
1984 පෙබරවාරි මස 22 දින.

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
රාජ්‍ය සංස්ථා ප්‍රධානීන් වෙත.

## <u>ස්වේච්ඡා බලකායේ සක්‍රීය සේවයට ප්‍රතිචාරය</u>

1949 අංක. 17 දරණ යුද්ධ හමුදා පනතේ 144 වගන්තියේ උපුටනයක් මීට අමුණා ඇත. එහි විධිවිධාන අනුගමනය කළයුතු බව කරුණාවෙන් දන්වමි.

Siriwardhana

ඩී. බී. අයි. පී. එස්. සිරිවර්ධන:
ලේකම්.
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.

– ඇමුණුම –

1949 අංක. 17 දරන යුද්ධ හමුදා පනතේ 144 වන වගන්තියේ උපුටනය

සේවා යෝජකයන්ගේ බැඳීම.

144. (1) තම සේවයෙහි යෙදී සිටින යම් තැනැත්තෙකුට ස්වේච්ඡා බල හමුදාවේ හෝ ස්වේච්ඡා උප සේවයේ සාමාජිකයකු වීමට හෝ සාමාජිකයකුව සිටීමට ද ඒ බල හමුදාවේ හෝ උප සේවයේ සාමාජිකයෙකු වූ එබඳු යම් තැනැත්තකුට මේ පනතේ බලය ප්‍රකාර ලැබීමට සහ ඉටු කිරීමට නියම කරනු ලබන සංග්‍රාමික පුහුණුව සහ සංග්‍රාමික සේවය ලැබීමට හා ඉටු කිරීමට ද හැකි වනු පිණිස නිසි පහසුකම් සියල්ල සලසා දීම සෑම සේවා යෝජකයකුගේම යුතුකම විය යුතුය.

(2) (අ) මේ වගන්තියේ (1) වන උප වගන්තියේ සඳහන් පහසුකම් සලසා නොදෙන, නැතහොත්

(ආ) ඒ උප වගන්තියේ සඳහන් යම් පුහුණුවක් හෝ සේවයක් ලැබීම හෝ ඉටු කිරීම නිසා සේවකයකු සේවයේ පහකරන නැතහොත් ඔහුගේ වැටුප් අඩුකිරීමෙන් හෝ වෙන යම් ක්‍රමයකින් දඬුවම් කරන

යම් සේවා යෝජකයකු වරදකට වරදකරු විය යුතුය. ඔහු සුළු අපරාධ විනිශ්චයකරුවකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විසඳීමකින් පසු වරදකරු කරනු ලැබූ කල්හි රුපියල් සීයයකට වැඩි නොවූ දඩයකට හෝ මාස හයකට වැඩි නොවූ කාලයක් වැඩ නැති හෝ බරපතල වැඩ ඇති බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ ඒ බන්ධනාගාරගත කිරීම යන දෙකටම යටත් විය යුතුය.